විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක:05/2016

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2016.10. 21

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>විශ්‍රාමිකයින්ට නිවාඩු දුම්රිය බලපත් නිකුත් කිරීම.</u>
<u>(මාර්ගගත (Online) ක්‍රමය යටතේ ඉල්ලුම් කිරීම)</u>

විශ්‍රාමිකයන් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා සරලව සිදු කිරීමේ අරමුණෙන් පහත සඳහන් උපදෙස් නිකුත් කරනු ලැබේ.

02. පළමුවර ලියාපදිංචිය.

I. විශ්‍රාමිකයින් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අදාළ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම දුම්රිය දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරනු ඇත. මෙම සේවාවන් ලබා ගැනීම සඳහා විශ්‍රාමිකයන් එක් වරක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලියාපදිංචි විය යුතුය. එසේ ලියාපදිංචි වීම සඳහා තොරතුරු ලබා ගැනීමට මේ සමඟ හඳුන්වා දෙන PD 07 ආකෘති පත්‍රය (ඇමුණුම 01) භාවිතා කළ යුතුය. විශ්‍රාමිකයන් ලියාපදිංචි කිරීම මාර්ගගත පද්ධතිය මඟින් (Online) සිදු කළ යුතු අතර, මෙම ලියාපදිංචිය සඳහා තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කළ හැකි වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පමණි. ඒ සඳහා දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති ප්‍රාදේශීය ලේකම් ද්වාරය (DS Portal) මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සලසා ඇත.මෙසේ දත්ත ඇතුළත් කිරීමට ප්‍රථම අයදුම්පත්‍ර සඳහා **ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය අනිවාර්යයෙන්ම** ලබාගත යුතුය.

II. එක් වරක් ලියාපදිංචි වූ විශ්‍රාමිකයෙකුගේ තොරතුරු යාවත්කාලීන කිරීමට අවශ්‍ය පහසුකම් ද පද්ධතිය තුළ සකසා ඇති අතර, මාසිකව පවත්වන කොට්ඨාශ දින රැස්වීමේදී ග්‍රාම නිලධාරී මඟින් විශ්‍රාමිකයාගේ හා පවුලේ සාමාජිකයන්ගේ තොරතුරු ලබාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් යුතුව යාවත්කාලීන කළ යුතුය.(පද්ධතිය භාවිතා කරන ආකාරය පිළිබඳ උපදෙස් ඇමුණුම 02 මඟින් දක්වා ඇත.)

(ඉහත I හා II හි ප්‍රාදේශීය ලේකම් මඟින් අනුමත කරනු ලබන අයදුම්පත් අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂා කර බැලීම සඳහා වෙනම ගොනුකර තැබිය යුතු වේ.)

03. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම.

ලියාපදිංචි වූ විශ්‍රාමිකයන් වෙත සාමාන්‍ය දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම පද්ධතිය භාවිතා කරමින් සිදු කළ හැකිය. (නව බලපත්‍රයේ ආකෘතිය ඇමුණුම 03 මඟින් දක්වා ඇත.) ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන දුම්රිය බලපත්‍රයට අදාළව ටිකට්පත් නිකුත් කිරීම දුම්රිය ස්ථානාධිපති විසින් පෙර පරිදිම සිදු කරනු ලැබේ.

04. ප්‍රධාන දුම්රිය ස්ථාන මඟින් සෘජුවම ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම.

ලියාපදිංචි වූ විශ්‍රාමිකයන්ට සෘජුවම ඇමුණුම 04 දක්වා ඇති දුම්රිය ස්ථානවලට පැමිණ විශ්‍රාමික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මඟින් දුම්රිය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට හැකියාව ඇත.(මෙම දුම්රිය ප්‍රවේශපත් ලබා ගැනීමේ දුම්රිය ස්ථාන, දුම්රිය දෙපාර්තමේන්තුවේ නියමයන් පරිදි ඉදිරියේදී වෙනස්විය හැකිය.)

05. මොබිටෙල් දුරකථන මඟින් විශ්‍රාමිකයන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම.

දුම්රිය බලපත්‍ර ලබා ගැනීමට ලියාපදිංචි වූ විශ්‍රාමිකයන් හට නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණීමකින් තොරව මොබිටෙල් දුරකථනය මඟින් 365 අංකය අමතා අවශ්‍ය තොරතුරු ලබා දීම මඟින් තම දුම්රිය බලපත්‍ර සඳහා ප්‍රවේශ පත්‍ර සෘජුවම වෙන් කරවා ගත හැක. ( මේ සඳහා දුරකථන ගාස්තුවක් විශ්‍රාමිකයාගේ දුරකථන බිල්පතට ඇතුළත් වනු ඇත.)

06. බිල්පත් පියවීම.

දුම්රිය බලපත්‍රවලට අදාළ බිල්පත් නිරවුල් කිරීම දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සෘජුවම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ඇත. ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පද්ධතියෙන් නිකුත් කරනු ලැබූ දුම්රිය බලපත්‍ර හා තුලනය වන පරිදි බිල්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

07. විශ්‍රාමිකයන්ට නිදහස් දුම්රිය බලපත්‍ර ලබා ගැනීම සඳහා වන සුදුසුකම්.

I. යැපෙන්නන්ගේ දීමනා, පුණ්‍යාධාර දීමනා ලබන්නන් හා අනත්දරුවන්ගේ සහ ආබාධිතයන්ගේ භාරකරුවන්ට දුම්රිය බලපත් හිමිකම නොමැති අතර, අනෙකුත් සියලුම විශ්‍රාමිකයින් වෙත දුම්රිය බලපත්‍ර ලබාගැනීමට හිමිකම ඇත.

II. දෙදෙනාම විශ්‍රාමිකයන් වන විට හෝ එක් අයෙක් විශ්‍රාමිකව,අනෙක් අය රජයේ සේවයේ නියුක්ත නම් දෙදෙනාගෙන් එක් අයෙකුට හිමි ඉහළ පංතියේ දුම්රිය බලපත් හිමිකම ලබා ගත හැකි අතර, පවුලේ යැපෙන්නන් සියලු දෙනා සඳහා ද එම හිමිකමපවතී.
උදා:- විශ්‍රාමික ස්වාමි පුරුෂයා II වන පංතියේ බලපත්‍රයට හා රජයේ සේවයේ නියුක්ත බිරිඳට I පංතියේ දුම්රිය බලපත්‍ර හිමිකම පවතී නම් I වන පංතියේ බලපත්‍ර හිමි ඇයට පවුලේ සිය සාමාජිකයන් වෙනුවෙන් දුම්රිය බලපත්‍ර අයදුම් කිරීමට හැකියාව පවතී.

III. විශ්‍රාමිකයින් හට වසරකට දුම්රිය බලපත් කට්ටල දෙකකට හිමිකම ඇත. කට්ටල දෙකක් යන්නෙන් අදහස් කරන්නේ (යාම සහ ඒම සඳහා වූ) ද්විත්ව ගමන් වාර දෙකක් හෝ තනිගමන් වාර හතරකි. විශ්‍රාමිකයින් සඳහා නිදන, නිරීක්ෂණ, වායු සමීකරණය කළ, වෙන්කළ මැදිරි පහසුකම් ලැබීමට හිමිකම ඇත.විශ්‍රාමිකයාගෙන් යැපෙන්නන් සඳහා ද මෙම හිමිකම ලැබේ.

IV. විශ්‍රාමිකයාගෙන් යැපෙන දරුවන්ට (රැකියා විරහිත අවිවාහක දරුවන්) වයස් සීමාව හෝ ස්ත්‍රී - පුරුෂ භාවය නොසලකා දුම්රිය බලපත්‍ර නිකුත් කළ හැකිය. දරුවන් තමන්ගෙන් (විශ්‍රාමිකයන්ගෙන්) යැපෙන බවට තහවුරු කළ යුතු අවස්ථාවලදීකොට්ඨාශය භාර ග්‍රාම නිලධාරීවරයාගෙන් සහතිකයක් මඟින් සනාථ කර ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්වන්නේ නම් පමණක් බලපත්‍ර නිකුත් කිරීම සිදු කළ හැකිය.

V. අවිවාහක විශ්‍රාමිකයකුගෙන්යැපෙන දෙමව්පියන්ට හා සහෝදර සහෝදරියන්ට මෙම බලපත්‍ර හිමිකම පවතී. එහිදී දෙමව්පියන්ගේ හා සහෝදර/සහෝදරියන්ගේ ආදායම් තත්ත්වය පරීක්ෂා කර බලා ඔවුන් විශ්‍රාමිකයාගෙන් යැපෙන බවට ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් සනාථ කිරීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්වන්නේ නම් පමණක් බලපත්‍ර නිකුත් කළ යුතු වේ. (දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ රජයේ නිලධාරියෙකු හෝ විශ්‍රාමිකයකු වන්නේ නම් හෝ සහෝදර සහෝදරියන් රැකියාවක නිරත වන්නේ නම් මෙම හිමිකම නොමැත.)

VI. විශ්‍රාමිකයින් වෙත දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී පංතිය නිර්ණය කිරීම පහත සඳහන් පරිදි සිදු කළ හැකිය.

I. ප්‍රාථමික ශ්‍රේණිය - 2 වැනි පංතිය
II. ද්විතීය ශ්‍රේණිය - 1 වැනි පංතිය
III. මාණ්ඩලික ශ්‍රේණිය - 1 වැනි පංතිය

VII. බලපත්‍ර අයදුම් කිරීමේදී, දුම්රිය ප්‍රවේශ පත්‍ර ලබාගැනීමේදී හෝ දුම්රියේ ගමන් කිරීමේදී විශ්‍රාමිකයාගේ හෝ යැපෙන්නන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය වන විශ්‍රාමික හැඳුනුම්පතහෝ ජාතික හැඳුනුම්පත අදාළ පාර්ශවයන් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

08. ම`විසින් නිකුත් කරන ලද 1990.10.31 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ ලිපි අංක 10/90 , 1995.11.13 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/95 , 2009.03.15 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 08/2009 හා 2009.06.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 08/2009 (සංශෝධන) යන චක්‍රලේඛ මෙම චක්‍රලේඛය නිකුත් කළ 2016.10.21 දින සිට අවලංගු කෙරේ.

09. මෙම චක්‍රලේඛය දුම්රිය සාමාන්‍යාධිකාරීගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

ඒ. ජගත් ඩී. ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.

2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.

3. ලේකම්,රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.හා අ.ක.ස.

4. ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.හා අ.ක.ස.

5. ලේකම්,මුදල් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.හා අ.ක.ස.

6. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.හා අ.ක.ස.

7. සාමාන්‍යාධිකාරී, දුම්රිය දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

8. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.